# වාර්ෂික වාර්තාව

**2014**

## ජාතික මෝස්තර මධ්‍යස්ථානය

# උගත් පාඩම් සහ හොඳම පරිචයන්

''අතීතය දෙස විමසීම් සහගතව බැලීම කිසිසේත්ම කාලය අපතේ යැවීමක් නොවේ.

සාර්ථකත්වය හා අනාගත වර්ධනය වෙනුවෙන් පූර්ව ක්‍රියාමාර්ග සහ ලැබූ අත්දැකීම් පිළිබඳව අවබෝධයක් තිබීම ඉතාම වැදගත් වේ. එවැනි පසු විපරමක් කිරීම තුල උගත් පාඩම් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමටත් ගුණාත්මක ප්‍රතිඵල පෙන්වූ හොඳම ක්‍රියාමාර්ගයන් හඳුනා ගැනීමටත් අවස්ථාව ලැබේ.

අවදානම් හඳුනාගැනීම සඳහා මෙන්ම අවම කරගැනීමේ ක්‍රියාවලිය සඳහා වඩාත් පහසුකම් සලසමින්, අපගේ ශක්තීන් හඳුනාගනිමින් සහ ඉහළ නංවමින් සහ ඵලදායීතාවය වර්ධනය කරමින් සේවාදායකයා වන හස්ත කර්මාන්ත ශිල්පියාට වඩාත් ඵලදායී නිර්මාණ විසඳුම් රැගෙන එන්නෙමු.

# අන්තර්ගතය

මග පෙන්වන මූලධර්ම

- දැක්ම
- මෙහෙවර

ආයතනික අරමුණු

හර වටිනාකම්

ආයතන පනත හා ලියාපදිංචිය

ආයතන කලමනාකාරිත්වය

අධ්‍යක්ෂ මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය

සභාපතිගේ පණිවුඩය

අධ්‍යක්ෂගේ පණිවුඩය

ආයතන ව්‍යුහය

මානව සම්පත්

මූල්‍ය කාර්ය සාධනය

සංවර්ධන ක්‍රියාකාරකම්

සේවා සැපයීම්

2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ අවසාන ගිණුම්

2014 ගිණුම් පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව

## මග පෙන්වන මූලධර්ම

**දැක්ම** :-

නිර්මාණ සංවර්ධනය හා
නව නිර්මාණාත්මක මෝස්තර හඳුන්වාදීම තුලින්
හස්තකර්මාන්ත ක්ෂේත්‍රය
වඩාත් සක්‍රිය
ආර්ථික ක්ෂේත්‍රයක් බවට පත් කිරීම.

**මෙහෙවර** :-

ප්‍රවර්ධනය, සංවර්ධනය,
හැකියාවන් ගොඩනැංවීම,
ප්‍රචලිත කිරීම සහ
ප්‍රධාන ප්‍රවාහයට අනුගත කිරීම තුලින්
වෙළඳපොල පාදක කරගත්
නිර්මාණාත්මක මෝස්තර හඳුන්වාදීම

.

## ආයතනික අරමුණු:-

- හස්ත කර්මාන්ත ශිල්පීන් විසින් දැනට නිෂ්පාදනය කරනු ලබන අත්කම් භාණ්ඩ සංවර්ධනය කිරීම සහ දේශිය මෙන්ම අපනයන වෙළඳපළෙහි වර්තමාන සහ අනාගත වෙළඳපල නැම්යාවන්ට අනුව නව නිර්මාණ හදුන්වා දීම.

- නිෂ්පාදන ධාරිතාව වැඩිකර ගැනීම සහ උසස් නිමාවකින් යුතු අත්කම් භාණ්ඩ නිෂ්පාදනය කිරීම අරමුණු කරගෙන නිසි තාක්ෂණික ක්‍රම හා අමුද්‍රව්‍ය පිළියෙල කරගැනීමේ ක්‍රම හදුන්වා දීම.

- ආදායම් වැඩිකර ගැනීම තුළින් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ වඩාත් යහපත් වර්ධනයක් අරමුණු කරගෙන ශිල්පීන්ට උසස් ශිල්පීය, තාක්ෂණික හා මෝස්තර සංවර්ධන පුහුණු සහාය ලබාදීම.

- හස්ත කර්මාන්ත ශිල්පීන්ට නව තාක්ෂණික ක්‍රම භාවිතා කිරීමට පහසුකම් සැලසීම සහ පොදු පහසුකම් සැලසීම සඳහා පොදු පහසුකම් සේවාවන් ලබාදීම.

- හස්තකර්මාන්ත නිර්මාණ සඳහා වඩාත් කාර්යක්ෂම, නව්‍ය නිෂ්පාදන ක්‍රමවේද හදුන්වාදීම.

- ප්‍රකාශණ, සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුස්තකාල පහසුකම් සැපයීම මගින් හස්ත කර්මාන්ත ශිල්පීන්ට, අලෙවිකරුවන්ට සහ හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට සම්බන්ධ වී සිටින්නන්ට අවශ්‍ය තොරතුරු ලබාදීම.

- රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන වල ඉල්ලීම් වලට අනුව මෝස්තර උපදේශක සේවාවන් ලබාදීම.

- මෝස්තර නිර්මාණාත්මක හැකියාවන් වර්ධනය කිරීම සහ වෘත්තීය අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම.

## (Core Values) හර වටිනාකම්

- ✓ අප වගකීමෙන් බැඳී සිටිමු
- ✓ අවංක හා විනිවිදභාවයෙන් යුතු වෙමු
- ✓ නිපුනත්වය හා එකමුතු ප්‍රයත්නයන් විශ්වාස කරමු
- ✓ නව තාක්ෂණය හා අභිරුචිය භාවිතා කිරීමට පෙළඹෙමු
- ✓ හොද පාරිභෝගික සේවාවක් ලබා දෙන බවට විශ්වාස කරමු

## ආයතන පනත හා ලියාපදිංචිය

1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා හා අනුබද්ධ ආයතන පනත යටතේ 1983 වර්ෂයේදී ආරම්භ කරන ලද ජාතික මෝස්තර මධ්‍යස්ථානය දේශිය හස්ත කර්මාන්තයේ උන්නතිය උදෙසා හස්තකර්මාන්ත ශිල්පීන් සම්ප්‍රදායෙන් ඔබ්බට ගෙන යමින් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය මූලික කරගෙන පිහිටුවනු ලැබූ සේවා සපයන රාජ්‍ය ආයතනයක් වන අතර මේ වන විට සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

## සංවිධානය

**ජාතික මෝස්තර මධ්‍යස්ථානය,** දේශිය හස්තකර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රගමනය උදෙසා දැක්ම හා මෙහෙවර අනුව යමින් ආයතනික අරමුණු ඉටු කරගැනීමට නිරතුරුවම ක්‍රියාත්මක වෙමින් සිටි. මෙහිදී මොරටුව, කටුබැද්ද, ද මැල් පාරේ අංක 10 දරණ ස්ථානයේ පිහිටි ප්‍රධාන කාර්යාලයේ මූලිකත්වයෙන් හා මධ්‍යම පළාත ආවරණය කරමින් මහනුවර, කලාපුරය, නත්තරම්පොත පිහිටුවා ඇති ශාඛා කාර්යාලයේ සහයෝගයෙන් විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරමින් හස්තකර්මාන්ත ශිල්පියා නඟා සිටුවීමට කැපවෙමින් සිටි.

එමෙන්ම සහතික පත් පාඨමාලා හා ඩිප්ලෝමා පාඨමාලා හරහා නව නිර්මාණකරුවන් බිහි කිරීමේ අධ්‍යාපනික ආයතනයක් ලෙස ද කටයුතු කරන ජාතික පිරිනිර්මාණ විද්‍යාලය ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ස්ථාපිත කර ඇති අතර, ඒ හරහා නිර්මාණශීලි හැකියාවන් ඇති තරුණ තරුණියන්ට ජාතික මට්ටමේ සිට ජාත්‍යන්තර තලය දක්වා වෘත්තීය දැනුමක් ලබා ගැනීමේ අවස්ථාව සළසා ඇත.
එමෙන්ම, නත්තරම්පොත ශාඛා කාර්යාලය තුල ස්ථාපිත පිත්තල, ලාක්ෂා හා සම් ආශ්‍රිත වැඩහල හා පොදු පහසුකම් මධ්‍යස්ථානය මඟින් හස්තකර්මාන්ත ශිල්පියාට අඛණ්ඩ සේවාවක් සපයයි.

ජාතික මෝස්තර මධ්‍යස්ථානය සිය දැක්ම ප්‍රධාන කොට ක්‍රියාත්මක මෙහෙවර තුළින් තම අරමුණු ඉටු කිරිමේදී ප්‍රධාන කාර්යාලයේ මූලිකත්වය ඇතිව හා නත්තරම්පොත පිහිටි ශාඛා කාර්යාලයේ සහයෝගය ඇතිව ක්‍රියාකාරී සැලැස්මට අනුව අදාල කාර්යයන් ක්‍රියාත්මක කෙරේ. මීට අමතරව සම්ප්‍රදයික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ මඟපෙන්වීමත්, පවතින අනෙකුත් විෂය සමගාමී ආයතන මෙන්ම පළාත් සභා හා හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට අදාල විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන් හි සහයෝගයත් නිරතුරුව මෙම ආයතනයේ කාර්යයන් ඉටුකිරීම සඳහා ඉවහල් වන අතර, මෙම ක්ෂේත්‍රයේ නියැලෙන ස්වේච්ඡා සංවිධාන, හස්ත කර්මාන්තකරුවෝ සහ වෙනත් බාහිර ආයතන ඉහත දැක්වෙන පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා නිරතුරුව සම්බන්ධ වේ.

සියළුම පරිපාලන, මූල්‍ය, අලෙවි ප්‍රවර්ධන කටයුතු, මෝස්තර සංවර්ධන, මෝස්තර අධ්‍යාපන, තාක්ෂණික සංවර්ධන මෙන්ම පර්යේෂණ හා සංවර්ධන යන ක්ෂේත්‍රයන්ට අදාල කාර්යයන් ද පොදු පහසුකම් හා පුස්තකාල සේවා සැපයීම ආදී ආයතනයේ ප්‍රධාන අරමුණු ඉටුකිරිමට අදාල සියළුම කාර්යයන් ප්‍රධාන කාර්යාලය මඟින් සිදුකරන අතර පරිපාලන, මූල්‍ය සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු හැර අනෙකුත් සියළු කටයුතු නත්තරම්පොත ව්‍යාපෘති කාර්යාලය මඟින් ද ඉටු කෙරේ.

| | | | |
|---|---|---|---|
| (i) | ප්‍රධාන කාර්යාලය | - | අංක 10, ද මෙල් පාර, කටුබැද්ද, මොරටුව. |
| | දුරකථන/ෆැක්ස් අංක | - | 011-2607114 - සභාපති |
| | | | 011-2626345 - අධ්‍යක්ෂ |
| | | | 011-2607814 - පොදු |
| | ෆැක්ස් | | 011-2607111 |
| | ඊ-මේල් | | slndcrisep@yahoo.com / info@slndc.gov.lk |
| (ii) | නත්තරම්පොත පොදු පහසුකම් මධ්‍යස්ථානය සහ වැඩහල | - | කලාපුරය, නත්තරම්පොත. |
| | දුරකථන අංකය / ෆැක්ස් | - | 081-2420038 |

# ආයතනික කළමණාකාරිත්වය

## අධ්‍යක්ෂ මණ්ඩලය

| | | |
|---|---|---|
| ඩී.ඩබ්. මාෂල් ජනතා මහතා | - | සභාපති- ජාතික මෝස්තර මධ්‍යස්ථානය |
| බුද්ධි කීර්තිසේන මහතා | - | සාමාජික |
| එස්. ශ්‍රී චන්ද්‍රන් මහතා | - | සාමාජික |
| අනෝමා ලෆීර් මහත්මිය | - | සාමාජික |
| සුදත් අබේසේකර මහතා | - | සාමාජික |
| සුජාතා වීරකෝන් මහත්මිය | - | සාමාජික |
| චින්තන ද සිල්වා මහතා | - | සාමාජික |
| අනිල් කොස්වත්ත මහතා | - | සාමාජික |
| තාරක දේවප්‍රිය මහතා | - | සාමාජික |
| වී. ජෙගරාජසිංහම් මහත්මිය | - | නිරීක්ෂක |

## ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වය

| | |
|---|---|
| ඩී.ඩබ්. මාෂල් ජනතා මහතා | - සභාපති - ජාතික මෝස්තර මධ්‍යස්ථානය |
| එම්.ඒ.එස්.එස්.කේ. චන්ද්‍රසිරි මහතා | - අධ්‍යක්ෂ - ජාතික මෝස්තර මධ්‍යස්ථානය |
| ඩේමියන් ද සිල්වා මහතා | - නියෝජ්‍ය අධ්‍යක්ෂ(මෝස්තර සංවර්ධන)<br>(කොන්ත්‍රාත් පදනම මත - 2014/07/01 සිට) |
| ජේ ඩබ් අයි ජයමිණි මිය | - නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ(පාලන)<br>(කොන්ත්‍රාත් පදනම මත - 2014/07/01 සිට) |
| ජේ.ඒ.ඒ.ආර්.සී. ගුණරත්න මහතා | - සහකාර අධ්‍යක්ෂ පර්යේෂණ (යාන්ත්‍රික) |
| ඒ. ඒ. ගාමිණී මහතා | - සහකාර අධ්‍යක්ෂ (මෝස්තර අධ්‍යාපන හා පුහුණු) |
| බී ආර් රණවීර මහත්මිය | - ගණකාධිකාරී |
| පී.කේ. විජේසිංහ මහතා | - සහකාර අධ්‍යක්ෂ(නත්තරම්පොත) |

**බැංකු කරුවෝ**

ලංකා බැංකුව - කටුබැද්ද

මහජන ඊංකුව - කටුබැද්ද

**විගණනය**

රජයේ විගණකාධිපති

විගණකාධිපති දෙපාර්තමේන්තු

# සභාපතිගේ පණිවුඩය

1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභාව හා අනුබද්ධ ආයතන පනතින් ස්ථාපිත 1983 සිට ක්‍රියාත්මක වන ජාතික මෝස්තර මධ්‍යස්ථානය සාම්ප්‍රදායික හස්ත කර්මාන්තකරුවා බිම් මට්ටමේ සිට ජාත්‍යන්තරය දක්වා ඔසවා තැබීමට මාහැගි සේවාවක් කල හැකි ජාතික ආයතනයකි.

දැක්ම හා මෙහෙවර අනුව යමින් 2014 වසරේදි ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් සිදු කරන ලද සේවාව ප්‍රශංසනීය වේ.

මෙම 2014 වසර ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වසර 31 ක පැවැත්ම සංකේතවත් කරන අතර, සේවා සපයන ආයතනයක් වන මෙම ආයතනය ක්‍රියාත්මක වන්නේ මහා භාණ්ඩාගාරයෙන් වෙන් කෙරෙන අරමුදල් වලිනි.

ක්ෂුද්‍ර හා සුළු පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම උදෙසා අවශ්‍ය අනෙකුත් සේවා අතර උපදේශන සේවා පැවැත්වීම අධ්‍යයන පුහුණු වැඩසටහන් පැවැත්වීම හා පාඨමාලා පැවැත්වීම හරහා මධ්‍යස්ථානය උපයාගත් සංචිත ආදායම පසුගිය වසරට සාපේක්ෂව වර්ධනය වී ඇති බව කැපී පෙනෙන කරුණකි.

සමාලෝචිත වර්ෂයේදි ආයතනික ඉලක්කයන් සපුරා ගැනීම උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදුන් සහයෝගය හා මගපෙන්වීමත්, කළමණාකරනය, කාර්ය මණ්ඩලය ඇතුලු සියලුම පාර්ශවකරුවන් විසින් ලබාදුන් සහයෝගය සහ කැපවීමත් මම කෘතඥ පූර්වකව සිහිපත් කරමි.

යහ පාලනය ක්‍රමවේදයන් හා අවස්ථානුකූලව අදාල කමිටු පත්කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගනිමින් මෙම ආයතනය ක්‍රියාත්මක වන අතර විදේශ ආධාර ව්‍යාපෘති හරහා පවත්වාගෙන යනු ලබන හස්ත කර්මාන්ත ශිල්පීන් නගා සිටුවීමේ වැඩසටහන් තුල ආයතනය සිය අරමුණු වඩාත් සාක්ෂාත් කරගනිමින් සිටී. ග්‍රාමීය ආර්ථිකයට සවියක් වනු වස් ක්‍රියාත්මක වන මෙම වැඩසටහන් බිම් මට්ටමේ සමාජ ආර්ථික තත්ත්වය වර්ධනය කිරීම කෙරේ මනා පිටුවහලක් වන බව කිව යුතුය.

ග්‍රාමීය ආර්ථිකය ඔසවා තැබීමට ඵලදායි ලෙස දායකත්වය ලබාදෙනු පිණිස මෙම මාහැගි කර්තව්‍යයට උරදෙමින් සිටින ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයටත්, සමස්ත කාර්ය මණ්ඩලයටත් මම මාගේ හෘදයාංගම ස්තූතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

මාෂල් ජනතා,<br>
සභාපති,<br>
ජාතික මෝස්තර මධ්‍යස්ථානය.

# අධ්‍යක්ෂගේ පණිවුඩය

2014 වර්ෂයේ ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ කාර්ය සාධනය සමාලෝචනය කිරීමට සහ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම මා ලැබූ මහඟු වරප්‍රසාදයන් කොට සලකමි. ආයතනයේ මූලික අරමුණු වලට සහ ජාතික සංවර්ධන සැලසුම්වලට සමගාමීව ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් මෙම වර්ෂ වලදී යම් ප්‍රගාමී ක්‍රියාමාර්ග ගෙන තිබෙන බව සඳහන් කල හැකිය.

රට තුල සාමය සහ ආරක්ෂාව තහවුරු කිරීම තුල ඇතිවී තිබෙන හිතකර වාතාවරණය ආර්ථික වර්ධනය උද්‍යාකර ගැනීම සඳහා මහත් ශක්තියක් වී තිබෙන බව පැහැදිලි කරුණකි. නිවැරදිව සකස්කර ඇති පිස්කල් හා මූල්‍ය ප්‍රතිපත්ති මෙරට ආර්ථිකය අඛණ්ඩව වර්ධනය කිරීම සඳහා අවශ්‍ය උත්තේජන සපයා දෙන අතර මෙම තත්ත්වය තුල දේශීය සුලු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳව විශේෂ අවධානය යොමු කල යුතුවේ.

හස්ත කර්මාන්තකරුවා නංවාලීම හා ඒ තුල ගැමි ආර්ථිකය ඔසවා තැබීම උදෙසා ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කරන ජාතික මෝස්තර මධ්‍යස්ථානය ග්‍රාමීය හස්ත කර්මාන්තකරුවා සංවර්ධනය කිරීම උදෙසා අවශ්‍ය සංවර්ධන ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීම උදෙසා ක්‍රියාමාර්ග ගනිමින් සිටී.

ව්‍යවස්ථානුකූල නියමයන්, මෙහෙවර සහ ආයතනික අනිවාර්ය්‍යය අවශ්‍යතාවන් අනුව ජාතික මෝස්තර මධ්‍යස්ථානය තම මිනිස්බල සැලැස්ම සකස් කොට ඇත.

දේශීය අමුද්‍රව්‍ය උපයෝගි කොටගෙන ක්‍රියාත්මක වන ග්‍රාමීය හස්ත කර්මාන්තය ඔප නැංවීම උදෙසා අවශ්‍ය මග පෙන්වීම් සහ අනුබල ලබාදුන් සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය ගරු ඩග්ලස් දේවානන්ද මහතාටත් එම නියෝජ්‍ය අමාත්‍ය ගරු වීරකුමාර දිසානායක මහතාටත් අමාත්‍යාංශයේ ලේකම් ශිවඥානසෝති මහතාටත් සමස්ත කාර්යය මණ්ඩලයටත් මාගේ අවංක කෘතවේදීත්වය මෙයින් පළ කර සිටිමි.

එම්. ඒ. එස්. එස්. කේ. චන්ද්‍රසිරි,
අධ්‍යක්ෂ,
ජාතික මෝස්තර මධ්‍යස්ථානය.



ආයතනික ව්‍යුහය

මූල්‍ය කාර්යය සාධනය

සංවර්ධන ක්‍රියාකාරකම්

සංවර්ධන වැඩසටහන්

නිර්මාණ ප්‍රදර්ශන

උපදේශන සේවා





අධ්‍යාපන සේවා

භෞතික ප්‍රගතිය

නව හස්ත කර්මාන්ත නිමැවුම

# ආයතන ව්‍යුහය



HM 1-3
MM 1-1
MM 1-1
JM 1-1
MA 5-1
MA 3
MA 2-1
MM 1-1
PL 3
PL 1 ....
සභාපති
අධ්‍යක්ෂ
නි. අ/ ස. අ. පාලන)
නි. අ. (මෝස්තර සංවර්ධන)
නි. අ. (මෝස්තර අධ්‍යාපන හා පුහුණු)
ගණකාධිකාරි
ස. අ. (මෝස්තර සංවර්ධන)
ස. අ. පර්යේෂණ (රසායනික)
ස. අ. පර්යේෂණ (අලෙවි)
ස. අ. පර්යේෂණ (යාන්ත්‍රික)
අභ්‍යන්තර විගණන නිලධාරි
පරිපාලන නිලධාරි
ගිණුම් නිලධාරි
ජ්‍යෙෂ්ඨ මෝස්තර සම්පාදක
වැඩසටහන් සම්බන්ධීකරණ නිලධාරි
මෝස්තර සම්පාදක
සංවර්ධන සහකාර
සංවර්ධන සහකාර
අලෙවි සහකාර
පුස්තකාල/තොරතුරු සහකාර
සංවර්ධන සහකාර
පෞද්ගලික සහකාර
පෞද්ගලික සහකාර
කළමණාකරන සහකාර 10
කළමණාකරන සහකාර
ශිල්ප උපදේශක 32
කළමණාකරන සහකාර
කළමණාකරන සහකාර
කළමණාකරන සහකාර
රියැදුරු 06
කාර්යාල සහායක 17
මුරකරු 04

## මානව සම්පත

| තනතුරු නාමය | සේවා ගණය | අනුමත | පවතින | පුරප්පාඩු | අධීක්ෂණ නිළධාරි |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ | HM 1-3 | 01 | 01 | - | සභාපති |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන හා පර්යේෂණ | MM 1-1 | 01 | 01 (කොන්ත්‍රාත්) | 01 | අධ්‍යක්ෂ |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෝස්තර අධ්‍යාපන හා පුහුණු) | MM 1-1 | 01 | - | 01 | |
| සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) | MM 1-1 | 01 | 01 (කොන්ත්‍රාත්) | 01 | |
| සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) | MM 1-1 | 01 | - | 01 | |
| සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා යාන්ත්‍රික) | MM 1-1 | 01 | 01 | - | |
| සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා අලෙවි) | MM 1-1 | 01 | - | 01 | |
| සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා රසායනික) | MM 1-1 | 01 | - | 01 | |
| ගණකාධිකාරි | MM 1-1 | 01 | 01 | - | |
| පරිපාලන නිළධාරි | JM 1-1 | 01 | 01 | - | |
| ගිණුම් නිළධාරි | JM 1-1 | 01 | 01 | - | |
| විගණන නිළධාරි | JM 1-1 | 01 | - | 01 | |
| ජ්‍යෙෂ්ඨ මෝස්තර සම්පාදක | JM 1-1 | 04 | 05 | - | |
| මෝස්තර සම්පාදක | MA 5-1 | 09 | 08 | 01 (කොන්ත්‍රාත්) | |
| වැඩසටහන් සම්බන්ධීකාරක | MA 5-1 | 01 | - | 01 | |
| අලෙවි සහකාර | MA 3 | 01 | - | 01 | |
| පුස්තකාල හා තොරතුරු සහකාර | MA 3 | 01 | - | 01 | |
| සංවර්ධන සහකාර | MA 3 | 03 | 02 | 01 | |
| පෞද්ගලික සහකාර | MA 2-1 | 02 | 02 | - | |
| කළමණාකරණ සහකාර | MA 1-1 | 10 | 14 | අතිරික්ත 4 | |
| ශිල්ප උපදේශක | MA 1-1 | 32 | 20 | 12 | |
| පුහුණු සහායක | PL 1-1 | 01 | 01 | - | |
| රියැදුරු | PL 3 | 06 | 06 | - | |
| කාර්යාල සහායක | PL 1-1 | 17 | 09 | 08 | |
| මුරකරු | PL 1-1 | 04 | 07 | අතිරික්ත 3 | |

| පෞද්ගලික වන සේ | | | | | |
|---|---|---|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ | JM 1-1 | | 02 | | |
| පුහුණු සහායක | PL - 1 | | 01 | | |

## උපදේශකත්වය හා සමස්ත අධීක්ෂණය

| සභාපති | | |
|---|---|---|
| **තනතුර** | **අනුමත** | **පවතින** |
| අධ්‍යක්ෂ | **01** | **01** |

## මෙහෙයවීම

| තනතුර | අනුමත | පවතින | පුරප්පාඩු |
|---|---|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 02 | -- | 02 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ(පාලන) | 01 | -- | 01 |
| සහකාර අධ්‍යක්ෂ පර්යේෂණ(යාන්ත්‍රික) | 01 | -- | -- |
| සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) | 01 | -- | 01 |
| සහකාරඅධ්‍යක්ෂ පර්යේෂණ(අලෙවි) | 01 | -- | 01 |
| සහකාර අධ්‍යක්ෂ පර්යේෂණ(රසායනික) | 01 | -- | 01 |
| ගණකාධිකාරි | 01 | -- | -- |



# සංවර්ධන ක්‍රියාවලියට සෘජුව සම්බන්ධ වූවෝ

| තනතුර | අනුමත | පවතින | පුරප්පාඩු |
|---|---|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන ) | 01 | 01 (කොන්ත්‍රාත්) | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ(පාලන) | 01 | 01 (කොන්ත්‍රාත්) | 01 |
| සහකාර අධ්‍යක්ෂ - පර්යේෂණ (යාන්ත්‍රික) | 01 | 01 | - |
| ජ්‍යෙෂ්ඨ මෝස්තර සම්පාදක | 04 | 05 | - |
| මෝස්තර සම්පාදක | 09 | 08 | 01 (කොන්ත්‍රාත්) |
| අලෙවි නිළධාරී | 01 | 01 | - |
| ශිල්ප උපදේශක | 32 | 20 | 12 |
| පුහුණු සහායක | -- | 03 | - |



## සංවර්ධන ක්‍රියාවලියට වක්‍රව සම්බන්ධවූවෝ

| තනතුර | අනුමත | පවතින | පුරප්පාඩු |
|---|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ පර්යේෂණ (යාන්ත්‍රික ) | 01 | 01 | -- |
| ගණකාධිකාරී | 01 | 01 | -- |
| පරිපාලන නිලධාරී | 01 | 01 | -- |
| අභ්‍යන්තර විගණක | 01 | -- | 01 |
| ගිණුම් නිලධාරී | 01 | 01 | -- |
| වැඩසටහන් සම්බන්ධීකරණ නිලධාරී | 01 | -- | 01 |
| සංවර්ධන සහකාර | 03 | 02 | 01 |
| පුස්තකාල/තොරතුරු සහකාර | 01 | -- | 01 |
| පෞද්ගලික සහකාර | 02 | 02 | -- |
| කළමණාකරණ සහකාර | 10 | 14 | 04 අතිරික්ත |
| රියැදුරු | 06 | 04 | 02 |
| කාර්යාල සහායක | 17 | 09 | 08 |
| මුරකරු | 04 | 07 | 03 අතිරික්ත |



# සංවිධාන ධූරාවලිය

සභාපති



## මූල්‍ය කාර්ය සාධනය

මූලික වශයෙන් සේවා සපයන ආයතනයක් ලෙස ක්‍රියා කරන ජාතික මෝස්තර මධ්‍යස්ථානය, රාජ්‍ය හා ව්‍යවස්ථාපිත මණ්ඩල යටතට ගැනෙන අතර ඊට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය වෙතින් සපයා ගනු ලබයි.

2014 වසරේ අනුමත අයවැය සහ භාණ්ඩාගාරය වෙතින් ලැබූ ප්‍රාග්ධන හා පුනරාවර්ථන ප්‍රතිපාදන පිළිබඳ දත්ත හා තොරතුරු පහත දැක්වේ.

## ප්‍රාග්ධන ප්‍රතිපාදන




## පුනරාවර්තන ප්‍රතිපාදන



ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් ඉටු කරනු ලබන සේවා අතර උපදේශන සේවාව විශේෂ ස්ථානයක් ගනු ලබන අතර උපදේශන සේවා සඳහා අයකරන ගාස්තු,  මෙන්ම පිරිනිර්මාණ ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා අය කෙරෙන ගාස්තු මඟින් ද රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන අනුග්‍රහයෙන් සිදුකරනු ලබන නව නිර්මාණ සංවර්ධන හා පුහුණු වැඩසටහන් මෙන්ම ව්‍යාපෘති සඳහා ලැබෙන ප්‍රතිපාදන ද ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ අරමුදලට එක් වන අතර ඒ අනුව මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන අරමුදල් පහත පරිදි වේ.

1. ජාතික මෝස්තර මධ්‍යස්ථාන අරමුදල (NDC)
2. සේවක ණය අරමුදල (SLC)
3. මෝස්තර උපදේශක සේවා අරමුදල (DCF)
4. අලෙවි පර්යේෂණ අරමුදල (TMF)
5. මෝස්තර අධ්‍යාපන හා පුහුණු අරමුදල (DET)

## සංවර්ධන ක්‍රියාකාරකම්-2014

### නව නිර්මාණ සැලසුම් කිරීම සහ සංවර්ධනය

නව නිර්මාණ සැළසුම් කිරීම හඳුන්වා දීම හා සංවර්ධනය කිරීම ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ කාර්ය භාරයන් හි ප්‍රමුඛ කාර්යයක් වන අතර ඒ තුලින් ග්‍රාමීය හස්ත කර්මාන්ත ශිල්පියා සවිබල ගැන්වීමත් දේශීය හා ජාත්‍යන්තර වෙළඳපල ඉලක්ක කොට කාලීන නිර්මාණ හඳුන්වාදෙමින් ග්‍රාමීය ආර්ථිකය ඉහළ නංවනු වස් හස්ත කර්මාන්තකරුවන් පෙළගැස්මත් අත්‍යාවශ්‍ය කටයුත්තකි.

මේ සදහා දේශීය අමුද්‍රව්‍ය යොදා ගැනෙන අතර සාම්ප්‍රදායික නිෂ්පාදන වලින් ඔබ්බට යමින් නව වෙළඳපලකට ප්‍රවේශ වීමට හස්තකර්මාන්ත ශිල්පියාට නිරතුරුව මඟපෙන්වන්නෙක් ලෙස ජාතික මෝස්තර මධ්‍යස්ථානය ක්‍රියා කරයි.

හස්තකර්මාන්ත විෂය තුල විහිදි ඇති සියළුම ක්ෂේත්‍ර සඳහා නව මෝස්තර නිර්මාණය කිරීම ජාතික මෝස්තර මධ්‍යස්ථානය මගින් සිදු කෙරෙන අතර පන් හා කෙඳි, රතු මැටි, කොහු, උණ හා වේවැල්, රෙදිපිළි, දැව, ලාක්ෂා, පිත්තල, සම් හා ආභරණ යන ක්ෂේත්‍ර මින් ප්‍රමුඛ ස්ථානයක් ගනී.

ජාතික මෝසතර මධ්‍යස්ථානයේ වැඩහල් තුල සංවර්ධනය කිරීම සඳහා සැලසුම් කරන ලද නව නිර්මාණ සංඛ්‍යාව

ඉලක්කය - 547

සපුරා ගැනීම - 481

හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ ඉල්ලීම් මත සැලසුම් කරන ලද නව නිර්මාණ සංඛ්‍යාව

ඉලක්කය - 113

සපුරා ගැනීම - 399

ඒ අනුව 2014 වසර තුල නව නිර්මාණ 660 ක් සැලසුම් කිරීමට ඉලක්ක කර තිබූ අතර, ප්‍රධාන කාර්යාලයේ මෝස්තර අංශයෙන් හා නත්තරම්පොත ශාඛා කාර්යාලයෙන් නව නිර්මාණ සැලසුම් 880 ක් සපුරාගෙන ඇත. ඊට අමතරව උපදේශන සේවා යටතේ හා පිටත ආයතන වල ඉල්ලීම මත ග්‍රැෆික් හා ගෘහ අභ්‍යන්තර අලංකරණ නිර්මාණ 30 ක් සිදු කිරීමට ඉලක්ක කර තිබූ අතර 104 ක් නිර්මාණ සැලසුම් කිරීමට මෝස්තර අංශය කටයුතු කර ඇත.



## නව නිර්මාණ මූලාදර්ශ බවට පරිවර්ථනය කිරීම.

නව නිර්මාණ සංකල්ප වලින් තෝරාගත් නිර්මාණ, මොරටුව සහ නත්තරම්පොත කාර්යාල පරිශ්‍රය තුල පිහිටි වැඩහල් මඟින් මූලාදර්ශ ලෙස සංවර්ධනය කිරීම සිදු කෙරෙන අතර වැඩහල තුල නිෂ්පාදනය කළ නොහැකි නිර්මාණ පිටත ශිල්පීන් මඟින් නිෂ්පාදනය කර ගැනීමට කටයුතු කෙරේ. ඒ අනුව වාර්ෂික ඉලක්කය, වැඩහල තුල 325 ක් හා පිටත ශිල්පීන් මඟින් 45 ක් වශයෙන් 370 ක් සංවර්ධනය කිරීමට ඉලක්ක කර ඇත.

නමුත් සියළු නව නිර්මාණ සැලසුම් ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වැඩහල් තුල මූලාදර්ශ බවට පරිවර්තනය කිරීමට 2014 වර්ෂයේ හැකියාව ලැබුණු බැවින් පිටත හස්ත කර්මාන්ත ශිල්පීන් හරහා මූලාදර්ශ බවට පත් කිරීමට අවශ්‍යතාවයක් නොමැති විය

නව නිර්මාණ මූලාදර්ශ බවට පරිවර්තනය කිරීම

ඉලක්කය - 370

සපුරා ගැනීම - 423

මෙහිදී පිත්තල, ලාක්ෂා හා සම් ආශ්‍රිත නව නිර්මාණ 190 ක් නත්තරම්පොත වැඩහල තුලින් මූලාදර්ශ බවට පත් කෙරුණු අතර, පන් හා කෙඳි, රතු මැටි, කොහු, උණ හා වේවැල්, රෙදිපිළි, දැව යන ක්ෂේත්‍ර මූලික කොට කරන ලද නිර්මාණ 233 ක් මොරටුව වැඩහල තුල මූලාදර්ශ බවට පත් කෙරුණි.

ඒ අනුව 2014 වර්ෂයේදී මුළු නව නිර්මාණ මූලාදර්ශ **423 ක්** හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට එළිදැක්වීමට හැකියාව ලැබුණි.

ව්‍යාපෘති හරහා ආයතනය විසින් ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩසටහන් හා පළාත් සභා, අපනයන සංවර්ධන මණ්ඩලය, ජාතික ශිල්ප සභාව හා අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන හරහා ක්‍රියාත්මක ශිල්පීය පුහුණු වැඩසටහන් තුලදී මෙම මූලාදර්ශ ශිල්පියාට හඳුන්වා දී ඔවුන් එම නව නිර්මාණ නිෂ්පාදනයට යොමු කරවීමට ක්‍රියා කරන අතර නව නිර්මාණ ප්‍රදර්ශන හා අලෙවි සල්පිල් මඟින් වැඩි ප්‍රමාණයක් ජාතික මෝස්තර මධ්‍යස්ථානයට සේවා ලබාගැනිම සඳහා පැමිණෙන ශිල්පීන් මඟින්, පළාත් සභා, අපනයන සංවර්ධන මණ්ඩලය, ජාතික ශිල්ප සභාව හා අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන හරහා ක්‍රියාත්මක ශිල්පීය පුහුණු වැඩසටහන් මඟින්, නව නිර්මාණ ප්‍රදර්ශන හා අලෙවි සල්පිල් මඟින් සහ ශ්‍රී ලංකා හස්තකර්මාන්ත මණ්ඩලය හරහා වෙළඳපලට හඳුන්වාදීමට කටයුතු කර ඇත .



## නව හස්තකර්මාන්ත නිර්මාණ ඔස්සේ සමරු නිර්මාණ එළිදැක්වීම

පසු ගිය වසරට සමගාමීව නිර්මාණ සංවර්ධනය හා නව නිර්මාණාත්මක මෝස්තර හදුන්වාදීම තුල හස්තකර්මාන්ත ක්ෂේත්‍රය වඩාත් සක්‍රිය වී ඇති අතර විශේෂයෙන්ම ග්‍රාමීය ආර්ථික ක්ෂේත්‍රය ජාතික සංවර්ධන වැඩපිළිවෙල ඔස්සේ ඉහළින් තැබීම පිණිස ජාතික මෝස්තර මධ්‍යස්ථානය හස්තකර්මාන්ත කෙෂ්ත්‍රය තුල කැපී පෙනෙන වැඩ කොටසක් ඉටු කොට ඇත. දේශීය හස්තකර්මාන්ත ශිල්පියාගේ ජීවන තත්ත්ව ඉහල නැංවීම උදෙසා දේශීය සංචාරක කර්මාන්තයේ දැවැන්ත සංවර්ධනය සමඟින් මෙරටට පැමිණෙන සංඛ්‍යාත්මක සංචාරක ප්‍රවර්ධනය කෙසේ ඉවහල් වන්නේද යන්න පිළිබඳ අවධානය යොමු කෙරෙන අතර එහිදි විදේශිකයන් ඉලක්ක කොට නිමැවෙන සමරු හා ත්‍යාග භාණ්ඩ ප්‍රමුඛ ස්ථානයක් ගනි.

එබැවින් ජාතික මෝස්තර මධ්‍යස්ථානය, දේශීය අනන්‍යතාවය පිළිඹිබු කෙරෙන සමරු හා ත්‍යාග භාණ්ඩ කෙරෙහි අවධානය යොමු කරමින් නව නිර්මාණ එළිදැක්වීමටත්, එම නිර්මාණ හස්තකර්මාන්ත ශිල්පියාට හදුන්වාදීමටත් ක්‍රියා කර ඇත. ඒ හරහා ඉලක්ක කළ සමරු හා ත්‍යාග භාණ්ඩ 22ක් වෙනුවෙන් පාර්ලිමේන්තුව, අනුරාධපුරය, දළදා මාළිගය, දේශීය අලියාගේ විවිධ ස්වරූපයන් වැනි දේශීය වටිනාකමක් ඇති දේ ඉලක්ක කරගනිමින් සමරු නිර්මාණයන් 24ක් නිර්මාණය කිරීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානය කටයුතු කර ඇත.

## නව නිර්මාණ සංවර්ධන වැඩසටහන්

නිරතුරුව වෙළඳපොල නැමියාවන් හදුනා ගනිමින් කටයුතු කරන ජාතික මෝස්තර මධ්‍යස්ථානය, වෙළඳපලට ගැලපෙන මෙන්ම වෙළඳපල තුල ඉල්ලුමක් ඇති කළ හැකි නව නිර්මාණ බිහි කරමින් ඒවා හස්තකර්මාන්ත ශිල්පියා හරහා වෙළඳපොලට ප්‍රවිෂ්ඨ කිරීමට කටයුතු කරයි.

මෙහිදී මහින්ද චින්තන ඉදිරි දැක්ම සංවර්ධන වැඩසටහන තුලින් හස්තකර්මාන්ත කෙෂ්ත්‍රයට ඉටුවිය යුතු මෙහෙවර පිළිබඳ මනා අවබෝධයකින් යුතුව ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. එමෙන්ම දිවි නැගුම සංවර්ධන වැඩසටහන, වැඩ කරන ජනතාවට ඒ තුලින් ඵලදායි මාවතක් විවර කරන්නට මූල්‍ය දයකත්වය ලබාදෙමින් මුළු දිවයිනම ආවරණය වන පරිදි ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ආරම්භ කර ඇති දැවැන්ත සංවර්ධන වැඩසටහනකි, මීට අමතරව, හස්තකර්මාන්ත කෙෂ්ත්‍රයේ උන්නතිය වෙනුවෙන් ආරම්භ කෙරුණු සාම්ප්‍රදයික හස්තකර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන ද මෙම වර්ෂය තුල ආරම්භ කෙරුණු ඵලදායි ව්‍යාපෘතියකි.

මෙම සියළු සංවර්ධන වැඩසටහන් වලට දයකත්වය ලබාදෙමින්, සාම්ප්‍රදයික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ මඟ පෙන්වීම හා උපදේශකත්වය යටතේ, විවිධ පළාත් ආවරණය කරමින් පහත සඳහන් ආකාරයට නව නිර්මාණ පිළිබඳ දැනුවත් කිරීමේ හා සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානයට හැකියාව ලැබුණි.

**ඉලක්කය**

- නව නිර්මාණ සංවර්ධන වැඩසටහන් - 59
- ප්‍රතිලාභීන් - 1260

**සපුරා ගැනිම**

- නව නිර්මාණ සංවර්ධන වැඩසටහන් - 61
- ප්‍රතිලාභීන් - 1758

## නව නිර්මාණ සංවර්ධන වැඩසටහන්

### 1. ක්‍රියාකාරී සැලැස්ම යටතේ

ප්‍රාග්ධන ප්‍රතිපාදන යොදාගනිමින් නව නිර්මාණ සංවර්ධන වැඩසටහන් 59ක් ප්‍රතිලාභින් 1260 දෙනෙකු සඳහා සිදු කිරීමට ඉලක්ක කළ අතර, ඒ යටතේ මෙන්ම විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල ඉල්ලීම් යටතේ නව නිර්මාණ සංවර්ධන වැඩසටහන් 61ක් ක්‍රියාත්මක කරමින් ප්‍රතිලාභීන් 1758 දෙනකු සඳහා සේවා ලබා දීමට කටයුතු කර ඇත.

පුහුණු වැඩසටහන් - 2014 - ක්‍රියාකාරී සැලැස්ම යටතේ ඇමුණුම- 01

| | වැඩසටහනේ ස්භාවය | ක්ෂේත්‍රය | ස්ථානය | ආරම්භක දිනය හා දින ගණන | සම්බන්ධිකරණ ආයතනය | මූල්‍ය දායකත්වය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | හඳුන්වාදුන් නව නිර්මාණ සංඛ්‍යාව | වගකීම දැරූ නිලධාරියා |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | දැනුවත් කිරීමේ වැඩසටහන හා පාසැල් ළමුන් සඳහා ප්‍රායෝගික වැඩසටහන | පොදු | කුරුණෑගල | ජනවාරි-27 | ජා.මෝ.ම. | ජා.මෝ.ම. | 61 174 | -- | |
| 2 | දැනුවත් කිරීමේ වැඩසටහන | වේවැල් | මඩකලපුව කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව | පෙබරවාරි-03 | කර්මාන්ත දෙපාර්තමේන්තුව - මඩකලපුව | ජා.මෝ.ම. | 40 | -- | ඩබ්.එම්.පියරත්න-ස.අ.(මෝ.ස.) |
| 3 | දැනුවත් කිරීමේ වැඩසටහන | වේවැල් | මොනරාගල-දඹගල්ල ප්‍රජා ශාලාව | පෙබරවාරි-05 | ජා.ශි.ස. | ජා.මෝ.ම. | 12 | -- | ඩබ්.එම්.පියරත්න-ස.අ.(මෝ.ස.) |
| 4 | නව තාක්‍ෂණික පුහුණු වැඩසටහන | රෙදිපිලි - තිරරෙදි | ජා.මෝ.ම. - කටුබැද්ද | මාර්තු 05 දින 02 | ජා.මෝ.ම. | ජා.මෝ.ම. | 14 | 12 | තමරා දමයන්ති-ස.අ.(මෝ.ස.) |
| 5 | නව නිර්මාණ හා තාක්‍ෂණික පුහුණු වැඩසටහන | වේවැල් | මොනරාගල-පො.ප.ම. | මාර්තු 26 දින 03 | ජා.ශි.ස. | ජා.මෝ.ම. | 16 | 9 | ඩබ්.එම්.පියරත්න-ස.අ.(මෝ.ස.) |
| 6 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | කොහු | කළුතර -බේරුවල-අළුත්ගම-කළුවාමෝදර | මාර්තු 25 දින 04 | විදාතා - බේරුවල | ජා.මෝ.ම. | 7 | 10 | චන්න පෙරේරා - මෝස්තර සම්පාදක නිලධාරී |
| 7 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | සම් ආශ්‍රිත | මහනුවර-නත්තරම්පොත | | ජා.මෝ.ම. | ජා.මෝ.ම. | 13 | | පී.කේ.විජේසිංහ ස.අ.(නත්තරම්පොත) |
| 8 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | කොහු | අනුරාධපුරය - රාජාංගනය | මැයි 30 දින 04 | රාජාංගනය ප්‍රා.ලේ. | ජා.මෝ.ම. | 20 | 10 | චන්න පෙරේරා - මෝස්තර සම්පාදක නිලධාරී |
| 9 | දැනුවත් කිරීමේ වැඩසටහන හා උසස් තාක්‍ෂණික වැඩසටහන | පන් හා කෙඳි | කොළඹ - පාදුක්ක අරුක්වත්ත | ජූනි23 දින 04 | ජා.ශි.ස. | ජා.මෝ.ම. | 27 | 10 | සෝමලතා ගම්ලත් ස.අ.(මෝ.ස.) |

| | වැඩසටහනේ ස්භාවය | ක්ෂේත්‍රය | ස්ථානය | ආරම්භක දිනය හා දින ගණන | සම්බන්ධීකරණ ආයතනය | මූල්‍ය දයකත්වය | ප්‍රතිලභීන් සංඛ්‍යාව | හඳුන්වාදුන් නව නිර්මාණ සංඛ්‍යාව | වගකීම දැරූ නිලධාරියා |
|---|---|---|---|---|---|---|---|---|---|
| 10 | නව නිර්මාණ පුහුණු වැඩසටහන හා උසස් තාක්ෂණික වැඩසටහන | දැව ආශ්‍රිත | අනුරාධපුරය - ගල්නෑව | ජුනි16 දින 05 | ගල්නෑව ප්‍රා.ලේ. | ජා.මෝ.ම. | 15 | 28 | බර්නාඩ් මනතුංග ස.අ.(මෝ.ස.) |
| 11 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | රෙදිපිළි- සැහැල්ලු සෙල්ලම් භාණ්ඩ | අනුරාධපුරය - නාච්චාදුව | ජුනි 25 දින 02 | නාච්චාදුව - ප්‍රා.ලේ.කා. | ජා.මෝ.ම. | 30 | 3 | තමරා දමයන්ති- ස.අ.(මෝ.ස.) |
| 12 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | විසිතුරු ආභරණ | මහනුවර - නත්තරම්පොත | ජුනි 23 දින 04 | ජා.මෝ.ම. | ජා.මෝ.ම. | 21 | 5 | පී.කේ.විජේසිංහ ස.අ.(නත්තරම්පොත) |
| 13 | නව නිර්මාණ හා නව තාක්ෂණික පුහුණු වැඩසටහන | කොහු | පුත්තලම - මාදම්පේ | ජුලි 28 දින 04 | ප්‍රා.ලේ.කා. මාදම්පේ | ජා.මෝ.ම. | 18 | 14 | බර්නාඩ් මනතුංග ස.අ.(මෝ.ස.) |
| 14 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | රෙදිපිළි- සැහැල්ලු සෙල්ලම් භාණ්ඩ | රත්නපුර- ඇහැලියගොඩ- පනාවල | ජුලි 21 දින 3 | ජා.ශි.ස. | ජා.මෝ.ම. | 20 | 3 | තමරා දමයන්ති- ස.අ.(මෝ.ස.) |
| 15 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | පේපර් පල්ප් | අනුරාධපුරය | ජුලි18 දින 03 | ජා.ශි.ස. | ජා.මෝ.ම. | 25 | 14 | විජිත බණ්ඩාර- ස.අ.(මෝ.ස.) |
| 16 | දැනුවත් කිරීමේ හා නව නිර්මාණ හඳුන්වාදීමේ වැඩසටහන | ආභරණ (රන් රිදී) | කෑගල්ල - දෙල්දෙණිය | ජුලි 24 දින 01 | ප්‍රා.ලේ.කා. දෙල්දෙණිය | ජා.මෝ.ම. | 6 | 9 | තුෂිනි විජේරත්න - මෝ. ස. |
| 17 | නව නිර්මාණ පුහුණු වැඩසටහන (නවකයින් සඳහා) | අත් කඩදාසි - මූලික | මහනුවර-කුණ්ඩසාලේ නත්තරම්පොත | ජුලි 30 දින3 | ජා.මෝ.ම. | ජා.මෝ.ම. | 20 | 5 | පී.කේ.විජේසිංහ ස.අ.(නත්තරම්පොත) |
| 18 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | දැව ආශ්‍රිත | අනුරාධපුරය- මධ්‍යම නුවරගම් පළාත- කටුකැලියාව | අගෝ. 12 දින 2 | ප්‍රා.ලේ.කා. | ජා.මෝ.ම. | 17 | 21 | බර්නාඩ් මනතුංග ස.අ.(මෝ.ස.) |
| 19 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | උණ බට | රත්නපුර- යටියන්තොට | අගෝ. 2 දින 03 | ජා.ශි.ස. | ජා.මෝ.ම. | 23 | 6 | ඩබ්.එම්. පියරත්න ස.අ.(මෝ.ස.) |
| 20 | දැනුවත් කිරීමේ වැඩසටහන | වේවැල් | ත්‍රිකුණාමලය-සාම්පූර් - ඉච්චලම්පත්තු | අගෝ. 4 දින 01 | කර්මාන්ත දෙපාර්තමේන්තුව | ජා.මෝ.ම. | 16 | -- | ඩබ්.එම්. පියරත්න ස.අ.(මෝ.ස.) |

| | වැඩසටහනේ ස්භාවය | ක්ෂේත්‍රය | ස්ථානය | ආරම්භක දිනය හා දින ගණන | සම්බන්ධීකරණ ආයතනය | මූල්‍ය දායකත්වය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | හඳුන්වාදුන් නව නිර්මාණ සංඛ්‍යාව | වගකීම දැරූ නිලධාරියා |
|---|---|---|---|---|---|---|---|---|---|
| 21 | නව නිර්මාණ හා නව තාක්ෂණික පුහුණු වැඩසටහන | වේවැල් | මඩකලපුව -එරාවූර් | අගෝ.22 දින 02 | කර්මාන්ත දෙපාර්තමේන්තුව | ජා.මෝ.ම. | 36 | 5 | ඩබ්.එම්. පියරත්න ස.අ.(මෝ.ස.) |
| 22 | නව නිර්මාණ හා නව තාක්ෂණික පුහුණු වැඩසටහන | සිප්පි | ත්‍රිකුණාමලය- කින්නියා | අගෝ.2 දින 03 | ජා.ශි.ස. | ජා.මෝ.ම. | 22 | 18 | විජිත බණ්ඩාර- ස.අ.(මෝ.ස.) |
| 23 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | රෙදි බෑග් | මහනුවර- නත්තරම්පොත | සැප් දින 03 | ජා.මෝ.ම. | ජා.මෝ.ම. | 20 | 3 | පී.කේ.විජේසිංහ ස.අ.(නත්තරම්පොත) |
| 24 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | රෙදිපිළි- | මාතර- දෙවිනුවර | ඔක්.29 දින 05 | ජා.ශි.ස. | ජා.මෝ.ම. | 22 | 4 | තමරා දමයන්ති- ස.අ.(මෝ.ස.) |
| 25 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | පේපර් පල්ප් | අනුරාධපුරය | ඔක් 16 දින 03 | ජා.ශි.ස. | ජා.මෝ.ම. | 22 | 6 | විජිත බණ්ඩාර- ස.අ.(මෝ.ස.) |
| 26 | නව නිර්මාණ හා නව තාක්ෂණික උසස් පුහුණු වැඩසටහන | ආභරණ | කොළඹ- කඩුවෙල රණාල | ඔක් 25 දින 03 | ප්‍රා.ලේ. හා සමෘද්ධි | ජා.මෝ.ම. | 34 | 35 | තුෂිනි විජේරත්න - මෝ. ස. |
| 27 | නව නිර්මාණ හා නව තාක්ෂණික උසස් පුහුණු වැඩසටහන | බතික් | නුවරඑළිය- කොත්මලේ | ඔක් 3 දින 10 | ජා.මෝ.ම. න,පොත | ජා.මෝ.ම. | 27 | 5 | පී.කේ.විජේසිංහ ස.අ.(නත්තරම්පොත) |
| 28 | දැනුවත් කිරීම හා නව නිර්මාණ පුහුණු වැඩසටහන. | ඉදිකොළ /තල්කොළ | කළුතර- රෙමුණගොඩ | ඔක් 30 දින 3 | ජා.මෝ.ම. | ජා.මෝ.ම. | 27 | | සෝමලතා ගම්ලත් ස.අ.(මෝ.ස.) |
| 29 | නව නිර්මාණ හා නව තාක්ෂණික උසස් පුහුණු වැඩසටහන | ආභරණ | බදුල්ල | දෙසැ.6 දින 3 | සොරනාතොට ප්‍රා.ලේ. | ජා.මෝ.ම. | 36 | 20 | තුෂිනි විජේරත්න - මෝ. ස. |
| 30 | නව තාක්ෂණික පුහුණු වැඩසටහන | උණ | ගාල්ල | නොවැ. 28 දින 05 | බද්දේගම | ජා.මෝ.ම. | 20 | | ඩබ්.එම්. පියරත්න ස.අ.(මෝ.ස.) |
| 31 | නව නිර්මාණ හා නව තාක්ෂණික උසස් පුහුණුවූ | දැව ආශ්‍රිත | බදුල්ල- පස්සර | දෙසැ.12 දින 2 | පස්සර | ජා.මෝ.ම. | 18 | 35 | බර්නාඩ් මනතුංග ස.අ.(මෝ.ස.) |
| 32 | නව නිර්මාණ හා නව තාක්ෂණික උසස් පුහුණු වැඩසටහන TOT | කොහු | මාතර- මඩිහ | දෙසැ.9 දින 3 | ද.ප.කර්මාන්ත දෙපාර්තමේන්තුව | ජා.මෝ.ම. | 12 | 10 | චන්න පෙරේරා - මෝස්තර සම්පාදක නිලධාරී |

| | වැඩසටහනේ ස්භාවය | ක්ෂේත්‍රය | ස්ථානය | ආරම්භක දිනය හා දින ගණන | සම්බන්ධිකරණ ආයතනය | මූල්‍ය දයකත්වය | ප්‍රතිලාභින් සංඛ්‍යාව | හදුන්වාදුන් නව නිර්මාණ සංඛ්‍යාව | වගකීම දැරූ නිලධාරියා |
|---|---|---|---|---|---|---|---|---|---|
| 33 | නව නිර්මාණ හා නව තාක්ෂණික උසස් පුහුණු වැඩසටහන | උණ | රත්නපුර යටියන්තොට | දෙසැ.02 දින 02 | යටියන්තොට | ජා.මෝ.ම. | 15 | 11 | ඩබ්.එම්. පියරත්න ස.අ.(මෝ.ස.) |
| 34 | නව නිර්මාණ හා නව තාක්ෂණික උසස් පුහුණු වැඩසටහන | වේවැල් | අම්පාර -උහන | දෙසැ.11 දින 03 | වන අඩවි කාර්යාලය | ජා.මෝ.ම. | 15 | 15 | ඩබ්.එම්. පියරත්න ස.අ.(මෝ.ස.) |
| 35 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | උණ | මාතලේ- කවුඩුපැලැල්ල | දෙසැ.10 දින 03 | ජා.මෝ.ම.-න,පොත | ජා.මෝ.ම. | 12 | 3 | ඩබ්.එම්. පියරත්න ස.අ.(මෝ.ස.) |
| 36 | නව තාක්ෂණික පුහුණු වැඩසටහන | ස්ක්‍රීන් ප්‍රින්ටින් | මාතලේ | දෙසැ.22 දින 03 | ජා.මෝ.ම.-න,පොත | ජා.මෝ.ම. | 21 | | පී.කේ.විජේසිංහ ස.අ.(නත්තරම්පොත) |
| | | | | | | | | | |

## විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල ඉල්ලීම් යටතේ නව නිර්මාණ සංවර්ධන වැඩසටහන්

| | වැඩසටහනේ ස්භාවය | විශේෂ සටහන් | ක්ෂේත්‍රය | ස්ථානය | ආරම්භක දිනය හා දින ගණන | සම්බන්ධීකරණ ආයතනය | මූල්‍ය දායකත්වය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | හඳුන්වාදුන් නව නිර්මාණ සංඛ්‍යාව | වගකීම දැරූ නිලධාරියා |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 37 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | සා.භ.ශ.ස. වැඩසටහන 2012/2013 | වෙස්මුණු | කළුතර හොරණ-බටුවිට | පෙබරවාරි-01 | ජා.මෝ.ම. | අමාත්‍යාංශය | 52 | 20 | විජිත බණ්ඩාර-ස.අ.(මෝ.ස. |
| 38 | දැනුවත් කිරීමේ වැඩසටහන | අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් | වෙස්මුණු | අම්බලන්ගොඩ - ප්‍රා.ලේ.කා. | අප්‍රේල් 29 | අම්බලන්ගොඩ - ප්‍රා.ලේ.කා. | ජා.මෝ.ම. | | | |
| 39 | නව තාක්ෂණික පුහුණු වැඩසටහන | ඉල්ලීම් මත | උණ ලී | මහනුවර - වටකුරුව | අප්‍රේල් 29 දින 2 | කර්මාන්ත දෙපාර්තමේන්තුව | කර්මාන්ත දෙපාර්තමේන්තුව | 40 | | ඩබ්.එම්. පියරත්න ස.අ.(මෝ.ස.) |
| 40 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | ඉල්ලීම් මත | උණ ලී | මහනුවර - වටකුරුව | ජූලි 22 දින 3 | කර්මාන්ත දෙපාර්තමේන්තුව | කර්මාන්ත දෙපාර්තමේන්තුව | 12 | 5 | ඩබ්.එම්. පියරත්න ස.අ.(මෝ.ස.) |
| 41 | පුහුණු වැඩසටහන | රාජ්‍ය නොවන සංවිධාන ඉල්ලීම් | පන් හා කෙඳි | මුලතිව්- තුනුක්කායි | මැයි 25 | රාජ්‍ය නොවන සංවිධාන | රාජ්‍ය නොවන සංවිධාන- Oxfarm | 24 | 11 | සෝමලතා ගම්ලත් ස.අ.(මෝ.ස. |
| 42 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | නිර්මාණ සංවර්ධන වැඩසටහන යටතේ | රෙදිපිළි-බතික් | යාපනය - චන්කනේ | ජූනි 2 දින 03 | අමාත්‍යාංශය | ජා.මෝ.ම. | 35 | 6 | තමරා දමයන්ති-ස.අ.(මෝ.ස. |
| 43 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | ශිල්පීන්ගේ ඉල්ලීම මත | රෙදිපිළි-සැහැල්ලු සෙල්ලම් භාණ්ඩ | අනුරාධපුරය | ජූනි 20 දින 02 | ජා.ශි.ස. | ජා.මෝ.ම. | 8 | 2 | තමරා දමයන්ති-ස.අ.(මෝ.ස. |
| 44 | නව තාක්ෂණික පුහුණු වැඩසටහන | ඉල්ලීම් මත | උණ හා දැව | මාතර අකුරැස්ස | ජූලි18 දින 01 | ජැටි ගෝල්ඩන් ආයතනය | ජා.මෝ.ම. හා ජැටි ගෝල්ඩන් ආයතනය | 29 | -- | ඩබ්.එම්. පියරත්න ස.අ.(මෝ.ස.) |
| 45 | නව නිර්මාණ පුහුණු වැඩසටහන(උසස්) | ඉල්ලීම් මත | තල්කොළ | යාපනය- තල් සංවර්ධන මණ්ඩලය | අගෝ. 6 දින 3 | තල් සංවර්ධන මණ්ඩලය | තල් සංවර්ධන මණ්ඩලය | 30 | 10 | සෝමලතා ගම්ලත් ස.අ.(මෝ.ස.) |
| 46 | නව තාක්ෂණික පුහුණු වැඩසටහන | ඉල්ලීම් මත | යන්ත්‍ර භාවිතය | මහනුවර - උඩුදුම්බර | අගෝ.21 | -- | -- | 15 | -- | පී.කේ.විජේසිංහ ස.අ.(නත්තරම්පොත) |

| | වැඩසටහනේ ස්භාවය | විශේෂ සටහන් | ක්ෂේත්‍රය | ස්ථානය | ආරම්භක දිනය හා දින ගණන | සම්බන්ධීකරණ ආයතනය | මූල්‍ය දායකත්වය | ප්‍රතිලාභින් සංඛ්‍යාව | හඳුන්වාදුන් නව නිර්මාණ සංඛ්‍යාව | වගකීම දැරූ නිලධාරියා |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 47 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | ළමා සංවර්ධන අරමුදල | සම් ආශ්‍රිත | ත්‍රිකුණාමලය | අගෝ.16 දින 3 | ළ.ස.ප | ළ.ස.අ | 13 | 5 | පී.කේ.විජේසිංහ ස.අ.(නත්තරම්පොත) |
| 48 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | ළමා සංවර්ධන අරමුදල | රෙදිපිළි | ත්‍රිකුණාමලය | අගෝ.16 දින 3 | ළ.ස.ප | ළ.ස.අ | 15 | 5 | තමරා දමයන්ති- ස.අ.(මෝ.ස.) |
| 49 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | ළමා සංවර්ධන අරමුදල | පොල්කටු ආශ්‍රිත | ත්‍රිකුණාමලය | අගෝ.16 දින 3 | ළ.ස.ප | ළ.ස.අ | 15 | 3 | තුෂිනි විජේරත්න - මෝ. ස. |
| 50 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | | රෙක්සීන් බෑග් | කාර්මික සංවර්ධන මණ්ඩලය- මාතලේ | සැප් දින 05 | ජා.මෝ.ම. | ජා.මෝ.ම. | 29 | 7 | පී.කේ.විජේසිංහ ස.අ.(නත්තරම්පොත) |
| 51 | දැනුවත් කිරීමේ වැඩසටහන | GIZ | කොහු | හම්බන්තොට- තංගල්ල | සැප් 05 | GIZ | GIZ | 5 | -- | චන්න පෙරේරා - මෝස්තර සම්පාදක නිලධාරී |
| 52 | නව තාක්‍ෂණික පුහුණු වැඩසටහන | ඉල්ලීම් මත | උණ | මහනුවර - වටකුරුව | සැප් 4 දින 02 | කර්මාන්ත දෙපාර්තමේන්තුව - මධ්‍යම | කර්මාන්ත දෙපාර්තමේන්තුව - මධ්‍යම | 22 | 4 | ඩබ්.එම්. පියරත්න ස.අ.(මෝ.ස.) |
| 53 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | ඉල්ලීම මත | රෙදිපිළි- බීරළු රේන්ද | කොළඹ- බොරැල්ල | ඔක්.11 | ජා.ශි.ස. | ජා.මෝ.ම. | 10 | 2 | තමරා දමයන්ති- ස.අ.(මෝ.ස.) |
| 54 | නව තාක්‍ෂණික පුහුණු වැඩසටහන | ඉල්ලීම් මත | උණ | ගම්පහ- මීගමුව | ඔක් 3 දින 01 | ප්‍රා.ලේ. හා විද්‍යා | ප්‍රා.ලේ. හා විද්‍යා | 15 | -- | ඩබ්.එම්. පියරත්න ස.අ.(මෝ.ස.) |
| 55 | දැනුවත් කිරීමේ වැඩසටහන | රාජ්‍ය නොවන සංවිධාන ඉල්ලීම් | තල් හා ගල්ලැහැ | මඩකලපුව | ඔක් 13 දින 4 | රාජ්‍ය නොවන සංවිධාන | රාජ්‍ය නොවන සංවිධාන- Oxfarm | 49 | -- | සෝමලතා ගම්ලත් ස.අ.(මෝ.ස.) |
| 56 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | ඉල්ලීම මත | රෙදිපිළි | මහනුවර-කුණ්ඩසාලේ | නොවැ. 12 දින 02 | ජා.මෝ.ම. | ජා.මෝ.ම. | 24 | -- | පී.කේ.විජේසිංහ ස.අ.(නත්තරම්පොත) |
| 57 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | ඉල්ලීම මත- NGO | රෙදිපිළි | කිලිනොච්චි | නොවැ. 03 දින 05 | NGO | NGO | 19 | 5 | පී.කේ.විජේසිංහ ස.අ.(නත්තරම්පොත) |
| 58 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | ඉල්ලීම මත- NGO | රෙදිපිළි | කිලිනොච්චි | නොවැ. 17 දින 05 | NGO | NGO | 20 | 6 | පී.කේ.විජේසිංහ ස.අ.(නත්තරම්පොත) |

| | වැඩසටහනේ ස්භාවය | විශේෂ සටහන් | ක්ෂේත්‍රය | ස්ථානය | ආරම්භක දිනය හා දින ගණන | සම්බන්ධිකරණ ආයතනය | මූල්‍ය දායකත්වය | ප්‍රතිලභින් සංඛ්‍යාව | හදුන්වාදුන් නව නිර්මාණ සංඛ්‍යාව | වගකීම දැරූ නිලධාරියා |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 59 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | ඉල්ලීම මත | රෙදිපිළි- බීරළු රේන්ද | කොළඹ | දෙසැම්බර් - දින 02 | -- | ජා.මෝ.ම. | 19 | 04 | තමරා දමයන්ති- ස.අ.(මෝ.ස.) |
| 60 | දැනුවත් කිරීමේ වැඩසටහන- නව තාක්‍ෂණය | ඉල්ලීම මත | -- | මහනුවර | නොවැ.12 දින 02 | නත්තරම්පොත | ජන තාක්‍ෂණ ආයතනය | 28 | -- | පී.කේ.විජේසිංහ ස.අ.(නත්තරම්පොත) |
| 61 | නව නිර්මාණ හා නව තාක්‍ෂණික උසස් පුහුණු වැඩසටහන | ඉල්ලීම මත -IDB | කොහු | කළුතර-පොතුපිටිය | දෙසැ.17 දින 2 | IDB | IDB | 13 | 10 | චන්න පෙරේරා - මෝස්තර සම්පාදක නිලධාරී |

## පුහුණු වැඩසටහන් - 2014- ඉල්ලීම් හා වෙනත් රාජ්‍ය නොවන සංවිධාන යටතේ සිදුකරන ලද

| | වැඩසටහනේ ස්භාවය | විශේෂ සටහන් | ක්ෂේත්‍රය | ස්ථානය | ආරම්භක දිනය හා දින ගණන | සම්බන්ධිකරණ ආයතනය | මූල්‍ය දයකත්වය | ප්‍රතිලභින් සංඛ්‍යාව | හදුන්වාදුන් නව නිර්මාණ සංඛ්‍යාව | වගකීම දරන නිලධාරියා |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | නව නිර්මාණ හදුන්වාදීමේ වැඩසටහන | සා.හ.ග.ස. වැඩසටහන 2012/2013 | වෙස්මූණු | කළුතර හොරණ- බටුවිට | පෙබරවාරි-01 | ජා.මෝ.ම. | අමාත්‍යාංශය | 52 | 20 | විජිත බණ්ඩාර- ස.අ.(මෝ.ස.) |
| 2 | දැනුවත් කිරීමේ වැඩසටහන | අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් | වෙස්මූණු | අම්බලන්ගොඩ - ප්‍රා.ලේ.කා. | අප්‍රේල් 29 | අම්බලන්ගොඩ - ප්‍රා.ලේ.කා. | ජා.මෝ.ම. | | | |
| 3 | නව තාක්ෂණික පුහුණු වැඩසටහන | TOT | උණ ආශ්‍රිත | මහනුවර-වටකුළුව දැව පුහුණු මධ්‍යස්ථානය | අප්‍රේල් 29 දින 02 | ජා.ශි.ස. | ජා.මෝ.ම. | 40 | | ඩබ්.එම්. පියරත්න ස.අ.(මෝ.ස.) |
| | පුහුණු වැඩසටහන | රාජ්‍ය නොවන සංවිධාන ඉල්ලීම් | පන් හා කෙඳි | මුලතිව්- තුනුක්කායි | මැයි 25 | රාජ්‍ය නොවන සංවිධාන | රාජ්‍ය නොවන සංවිධාන- Oxfarm | 24 | 11 | සෝමලතා ගම්ලත් ස.අ.(මෝ.ස.) |
| 4 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | ශිල්පීන්ගේ ඉල්ලීම මත | රෙදිපිළි- සැහැල්ලු සෙල්ලම් භාණ්ඩ | අනුරාධපුරය | ජුනි 20 දින 02 | ජා.ශි.ස. | ජා.මෝ.ම. | 8 | 2 | තමරා දමයන්ති- ස.අ.(මෝ.ස.) |
| 5 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | නිර්මාණ සංවර්ධන වැඩසටහන යටතේ | රෙදිපිළි- බතික් | යාපනය - චන්කනේ | ජුනි 2 දින 03 | අමාත්‍යාංශය | ජා.මෝ.ම. | 35 | 6 | තමරා දමයන්ති- ස.අ.(මෝ.ස.) |
| 6 | පුහුණු වැඩසටහන | රාජ්‍ය නොවන සංවිධාන ඉල්ලීම් | පන් හා කෙඳි- ගල්ලැහැ පැදුරු | මුලතිව්- තුනුක්කායි | ජූලි 29 දින 03 | රාජ්‍ය නොවන සංවිධාන- Oxfarm | රාජ්‍ය නොවන සංවිධාන- Oxfarm | 18 | 14 | සෝමලතා ගම්ලත් ස.අ.(මෝ.ස.) |
| 7 | දැනුවත් කිරීමේ වැඩසටහන | Shipa | පොදු | කොළඹ- කඩුවෙල ප්‍රා.ලේ. | මාර්තු 14 | | | 160 | | |
| 8 | දැනුවත් කිරීමේ වැඩසටහන | Shipa | පොදු | වවුනියාව | මාර්තු 25 | | | 127 | | |
| 9 | දැනුවත් කිරීමේ වැඩසටහන | Shipa | පොදු | මුලතිව් | මාර්තු 26 | ජා.ශි.ස. | ජා.ශි.ස. | 87 | | විජිත බණ්ඩාර- ස.අ.(මෝ.ස.) |
| 10 | දැනුවත් කිරීමේ වැඩසටහන | Shipa | පොදු | මන්නාරම | මාර්තු 27 | | | 163 | | |
| 11 | දැනුවත් කිරීමේ වැඩසටහන | Shipa | පොදු | යාපනය | මාර්තු 28 | | | 182 | | |
| 12 | දැනුවත් කිරීමේ වැඩසටහන | Shilpa | | ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, කළුතර,ගම්පහ | මැයි 20,21,22 | ජා.ශි.ස. | ජා.ශි.ස. | | | |

## 2. සාම්ප්‍රදායික හස්තකර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන - 2014 යටතේ

සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් දියත් කරනු ලැබූ මෙම ව්‍යාපෘතිය යටතේ ජාතික මෝස්තර මධ්‍යස්ථානයට 2014 වර්ෂය සඳහා රු. මිලියන 14ක මුදලක් වෙන්කරනු ලැබූ අතර, ඒ යටතේ පහත සඳහන් ගම්මාන 11ක් සඳහා නව නිර්මාණ සංවර්ධන වැඩසටහන් පැවැත්වීමට හා හස්තකර්මාන්ත ශිල්පීන්ව වෙළඳපලට යොමු කරවීමට කටයුතු කෙරුණි.

| දිස්ත්‍රික්කය | ගම්මානය | හස්තකර්මාන්ත ක්ෂේත්‍රය | ආයෝජිත මුදල - රු. මි. |
|---|---|---|---|
| **මැටි ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ** | | | |
| මඩකලපුව | චිරාවූර් | රතුමැටි | 3.3 |
| නුවරඑළිය | පුරාණගම | රතුමැටි | 1.4 |
| මාතර | කුඹල්ගම | රතුමැටි | 1.3 |
| | | | |

| | | | |
|---|---|---|---|
| **හස්තකර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ** | | | |
| යාපනය | අල්ලාරෙයි | කොහු | 0.88 |
| පොළොන්නරුව | මනම්පිටිය | වේවැල් | 1.06 |
| මාතර | කියාදුව | උණ හා වේවැල් | 1.05 |
| මහනුවර | තලගුණේ | දුම්බර රටා | 0.65 |
| කුරුණෑගල | ගලතරය | තළකොළ | 0.3 |
| **ව්‍යවසායකත්ව ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ (ජාතික ශිල්ප සභාව හා සම්බන්ධව)** | | | |
| කුරුණෑගල | නුගවෙල -ඉහල කලල්පිටිය | තළකොළ | |
| නුවරඑළිය | ගිණිගත්හේන | රෙදිපිළි | |
| මාතලේ | මවුස්සාගොල්ල | ලාක්ෂා | |

මීට අමතරව, මෙම ව්‍යාපෘතිය යටතේ කාර්මික සංවර්ධන මණ්ඩලය හා ජාතික ශිල්ප සභාව විසින් සංවර්ධනය කිරීමට නියමිත වූ පහත සඳහන් ගම්මානයන්හි හස්තකර්මාන්ත ශිල්පීන්ට නව නිර්මාණ හඳුන්වාදීමේ කාර්යය ජාතික මෝස්තර මධ්‍යස්ථානය වෙත පැවරුණ අතර, එම කාර්යයද අප විසින් ඉටු කරන ලදි.

| දිස්ත්‍රික්කය | ගම්මානය | හස්තකර්මාන්ත ක්ෂේත්‍රය |
|---|---|---|
| කළුතර | රෙමුණගොඩ | ඉදිකොළ |
| මාතර | දෙවුන්දර | බීරළු රේන්ද |
| කෑගල්ල | දැරණියගල | දැව ආශ්‍රිත |
| කොළඹ | කඩුවෙල | රතුමැටි |
| මාතර | දික්වැල්ල | රතුමැටි |
| ගම්පහ | මිනුවන්ගොඩ | රතුමැටි |
| කුරුණෑගල | උඩුබද්දාව | රතුමැටි |

**සාම්ප්‍රදායික හස්තකර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන - 2012/2013**

උක්ත වැඩසටහන යටතේ 2012/2013 යන වර්ෂ වලදී හස්තකර්මාන්ත ගම්මාන 07ක් සංවර්ධනය කිරීමට කටයුතු කළ අතර, ඒ අතරින් 2014 වර්ෂය තුල පහත සඳහන් ගම්මාන 06 හි ශිල්පීන්ට උපකරණ, සහතිකපත් හා වැඩහල් පවරා දීම වැනි කාර්යයන් ඇතුලත් විවෘත කිරීමේ උත්සව පවත්වන ලදි.

| | **හස්තකර්මාන්ත ක්ෂේත්‍රය** | **දිස්ත්‍රික්කය** | **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය** | **ගම්මානය** |
|---|---|---|---|---|
| 01 | ලාක්ෂා | මාතලේ | රත්තොට | පහළහපුවිද |
| 02 | දැව | ගාල්ල | බෝපේ පෝද්දල | බෝපේ පෝද්දල |
| 04 | වෙස්මුහුණු | කළුතර | හොරණ | බණ්ඩාරවත්ත, මව්ගම(බටුවිට) |
| 05 | සේසත් | මාතලේ | යටවත්ත | උනවේරුව |
| 06 | ආභරණ | මහනුවර | පහලහේවාහැට | නීලවල |
| 07 | සංගීත භාණ්ඩ | මහනුවර | උඩුනුවර | කූරගල |

**හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට නව නිර්මාණ හදුන්වා දීම**

2014 වර්ෂය තුල නව නිර්මාණ 500 ක් හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට හදුන්වාදීමට ඉලක්ක කළ අතර 622 ක් සපුරා ගැනීමට හැකියාව ලැබුණි..

**රාජ්‍ය නොවන සංවිධාන සමඟ ඒකාබද්ධව නව නිර්මාණ හදුන්වාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

**ජාතික මෝස්තර මධ්‍යස්ථානය උතුරු, උතුරු නැගෙනහිර යන පළාත් හි හස්තකර්මාන්ත ශිල්පින් වෙනුවෙන් පවත්වන ලද නව නිර්මාණ සංවර්ධන හා වෙලඳපල සම්බන්ධතා ගොඩනැංවීමේ වැඩසටහන**

ජාතික මෝස්තර මධ්‍යස්ථානය විවිධ රාජ්‍ය නොවන සංවිධාන වල ඉල්ලීම් හා ප්‍රතිපාදන යටතේ හස්තකර්මාන්ත නව නිර්මාණ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරමින් උතුරු, උතුරු නැගෙනහිර සහ දකුණු වැනි පළාත් වල හස්තකර්මාන්ත ශිල්පීන්ගේ ජීවන තත්වය නඟා සිටුවීමට කටයුතු කර ඇත.

මෙම වර්ෂයේදී ප්‍රධාන වශයෙන් රාජ්‍ය නොවන සංවිධානයක් වන OXFAM ආයතනය සමඟ එක්ව මුලතිව් දිස්ත්‍රික්කයේ තුනුක්කායි ගම්මානයේ ගල්ලැහැ පැදුරු ආශ්‍රිත නව නිර්මාන සංවර්ධන වැඩසටහනක් අදියර කිහිපයකින් ක්‍රියාත්මක කරමින් එම ශිල්පින්ට නව නිර්මාණ පිළිබඳ මනා අවබෝධයක් ලබා දිමට කටයුතු කෙරුණි.

ඊට අමතරව, BMICH හි පැවති නව නිර්මාණ ප්‍රදර්ශණයේදී එම ශිල්පින්ට තම නිෂ්පාදන අලෙවි කර ගැනිමට අවශ්‍ය ඉඩකඩ ලබා දුනි.

තවද ළමා සංවර්ධන අරමුදල යටතේ ලද ප්‍රතිපාදන මඟින් ත්‍රිකුනාමලය දිස්ත්‍රික්කයේ සම්, රෙදිපිළි හා පොල්කටු ආශ්‍රිත නව නිර්මාණ සංවර්ධන වැඩසටහන් පැවැත්වීමට හැකියාව ලැබුණි.

**සම්ප්‍රදායෙන් ඔබ්බට (Beyond Tradition) නව නිර්මාණාත්මක හස්ත කර්මාන්ත ප්‍රදර්ශණය**

ශිල්ප උදන - 2014 ජාතික හස්තකර්මාන්ත ප්‍රදර්ශනයට සමඟාමීව ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ නව නිර්මාණ එළිදැක්වීම සඳහා **නව නිර්මාණාත්මක හස්තකර්මාන්ත ප්‍රදර්ශණය** 2014 අගෝස්තු මස 28 සිට 31 දක්වා සිරිමාවෝ බණ්ඩාරනායක ප්‍රදර්ශණ පරිශ්‍රයේදී පවත්වන ලද අතර, එහිදී නව නිර්මාණ 400කට අධික ප්‍රමාණයක් ප්‍රදර්ශණය කරමින් ශිල්පීන්ට එම නව නිර්මාණ හදුන්වාදීමත්, වෙළඳපල සම්බන්ධතා ගොඩනැංවීමත් සිදුකරන ලදි. අතර, ඒ හරහා **අලෙවි ප්‍රවර්ධන වැඩසටහනක්** ක්‍රියාත්මක කරමින් ශිල්පීන්/කාන්තා සංවිධාන 06කට අලෙවි කුටි පහසුකම් ලබාදෙමින් ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් හදුන්වාදෙන ලද, ශිල්පීන් විසින් නිෂ්පාදනය කරන ලද නිර්මාණ අලෙවි කරගැනිම සඳහා අවස්ථාව උදකර දෙන ලදි.

එමෙන්ම තෝරාගත් නව නිර්මාණ ඇතුලත් කර මුද්‍රණය කරන ලද නව නිර්මාණ අත්පොත, ප්‍රදර්ශනය නැරඹීමට පැමිණි ශිල්පීන්, ගැණුම්කරුවන් හා ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන් වෙත ලබාදෙමින් නව නිර්මාණ පිළිබඳ දැනුවත් කරන ලද අතර, ඒ හරහා නව නිර්මාණාත්මක හස්තකර්මාන්ත නිෂ්පාදන ජනයා අතර ප්‍රචලිත කිරීමට අවස්ථාව ලැබුණි.

**<u>ජාතික මෝස්තර මධ්‍යස්ථානය හරහා උපදේශන සේවා</u>**

**මෝස්තර උපදේශක සේවා සම්බන්ධීකරණය**

| සේවාව සඳහා ඉල්ලීම් කරන ලද ආයතනය | කාර්යය |
|---|---|
| ජාතික ශිල්ප සභාව | ශිල්ප 2013 සඳහා සම්මාන හා තිළිණ නිෂ්පාදනය |
| ගාළු උරුමය පදනම | ප්‍රකාශිත චිත්‍ර හා ප්‍රතිමා නිර්මාණය |
| සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය | නර්තන, සංගීත, දිස්ත්‍රික්,දේශනේත්‍ර, ශූරතා,අනුශූරතා, චිත්‍ර, යන සම්මාන නිෂ්පාදනය |
| සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය | අන්තර් රාජ්‍ය සේවක, ප්‍රතිභා කෙටි නාට්‍ය යන සම්මාන නිෂ්පාදනය |
| රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | සැපයුම්කරුවන්ට සම්මාන පිරිනැමීමේ උළෙල -2014 - රන්,රිදී හා ලෝකඩ සම්මාන නිෂ්පාදනය |
| රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | ප්‍රතිචක්‍රීය අත්කඩදසි පෙට්ටි නිෂ්පාදනය |
| තල් සංවර්ධන මණ්ඩලය | අභ්‍යන්තර අලංකරණ කටයුතු |

**<u>ශිල්ප 2014 ප්‍රදර්ශණය</u>**

සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ උපදේශකත්වය ඇතිව ජාතික ශිල්ප සභාව විසින් සංවිධානය කර පවත්වනු ලැබූ උක්ත ප්‍රදර්ශණයේ පූර්ව රාජකාරි යටතේ දිස්ත්‍රික් මට්ටමින් හස්තකර්මාන්ත ශිල්පීන් දැනුවත් කිරීමේ සියළු වැඩසටහන් සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ දායකත්වය ලබාදෙමින් නව නිර්මාණ සම්බන්ධ උපදේශකත්වය ලබාදීමට කටයුතු කෙරුණි. ඊට අමතරව, ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ නව නිර්මාණ ප්‍රදර්ශණය ශිල්ප 2014 ප්‍රදර්ශණයට සමගාමීව පවත්වන ලදි.

**<u>දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය</u>**

සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතේ මෙම ප්‍රදර්ශන පැවැත්වූ දින 10 තුල ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ නව නිර්මාණ එළිදැක්වීමේ ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යමින් හස්තකර්මාන්ත සඳහා උනන්දුවක් දක්වන්නන්ට අවශ්‍ය දැනුවත් කිරීම් හා සේවාවන් ලබාදෙන ලදි.

ඊට අමතරව, මෙම ප්‍රදර්ශණය ඉලක්ක කරගනිමින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ පාසැල් ළමුන්ට නව නිර්මාණ සංකල්ප හදුන්වාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරමින් ඔවුන්ව නව නිර්මාණ කිරීමට යොමු කරන ලදි. මේ සඳහා සිසුන් 200 දෙනෙකු සම්බන්ධ කරගත් අතර, ඔවුන් විසින් සිදුකරන ලද නව නිර්මාණ අතුරින් තෝරාගත් නිර්මාණ දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයේදී ප්‍රදර්ශණය කිරීමටත්, ජයග්‍රාහී නිර්මාණ සඳහා ත්‍යාග හා සහතිකපත් ප්‍රදානය කිරීමත්, මෙම ප්‍රදර්ශණ පරිශ්‍රය තුලදී සිදුකරන ලදි.

**ඊට අමතරව පහත සඳහන් ප්‍රදර්ශන සඳහා සහභාගි වෙමින් ප්‍රදර්ශණ පැවැත්වූ කාලය තුල නව නිර්මාණ ප්‍රදර්ශන කුටි පවත්වාගෙන යමින් නරඹන්නන්ට ආයතනය පිළිබඳ හා හස්තකර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳ දැනුවත් කිරීම් සිදු කරන ලදි.**

යෞවන කටයුතු හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද **ජාත්‍යන්තර තරුණ සමුළුව** - 2014

**දක්ෂිණ ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශණය** - මෙය CDC Events & Travels (Pvt) Ltd විසින් සංවිධානය කරන ලදි.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලද **SMEDEX – 2014 වෙළඳ ප්‍රදර්ශණය**

**වසන්ත මේලා** - නාවින්න සී/ස. මහයායවත්ත සකසුරුවම් හා ණය ගණුදෙනු සමූපකාර සමිතිය විසින් මෙම ප්‍රදර්ශණය සංවිධානය කරන ලදි.

ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද **Intrade Expo – 2014**

**අලෙවි පර්යේෂණ වැඩසටහන**

ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ අලෙවි අංශය හා මෝස්තර අංශය එක්ව කොළඹ ප්‍රදේශයේ දින 03ක අලෙවි පර්යේෂන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදි. මේ හරහා මෝස්තර අංශය විසින් නිර්මාණය කරන ලද නව නිර්මාණ කෙරෙහි වෙළඳපල නැඹුරුව පිළිබඳ ප්‍රායෝගික අත්හදා බැලීමක් සිදු කරන ලදි.

**පුස්තකාල සේවා සහ තොරතුරු සැපයීම**

කටුබැද්ද ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ මෙන්ම නත්තරම්පොත ශාඛා කාර්යාලයේ පිහිටි පුස්තකාල සඳහා වෙන්කරන ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන හරහා මේ වර්ෂය වෙනුවෙන් පොත් මිලදී ගෙන පුස්තකාලය සංවර්ධනය කිරීමට කටයුතු කළ අතර, හස්තකර්මාන්ත ශිල්පීන් හා ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන්නන් 111 දෙනෙකු සඳහා පුස්තකාල සේවා සහ තොරතුරු සැපයීම හා පොත් ආශ්‍රයෙන් අවශ්‍ය නිර්මාණයන්හි ඡායා පිටපත් ලබාදීමේ සේවාවද මේ හරහා සිදුකිරීමට කටයුතු කෙරුණි.

මීට අමතරව මෙම වර්ෂය තුල රු 292,000 ක නව පොත් මිලදී ගෙන පුස්තකාලයේ පොත් එකතුව වැඩි කරන ලදි.

**පිරිනිර්මාණ අධ්‍යාපන හා පුහුණු කටයුතු**

**ශ්‍රී ලංකා ජාතික පිරිනිර්මාණ ආයතනය**

**පිරිනිර්මාණකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (2014- 2015) (සති අන්ත)**
මෙම වර්ෂයේදී උක්ත පාඨමාලාව සඳහා සිසුන් 70 දෙනෙකු සම්බන්ධ විය

**පිරිනිර්මාණකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (2013- 2014) (සති අන්ත)**
මෙම වර්ෂයේදී උක්ත පාඨමාලාව සඳහා සිසුන් 28 දෙනෙකු සම්බන්ධ විය

**ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වෙබ් අඩවිය**
2012 වර්ෂයේ ආරම්භ කරන ලද ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වෙබ් අඩවිය මෙම වර්ෂය තුල 2055 දෙනෙකු භාවිතා කර ඇති අතර, ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ විසින් නිර්මාණය කරන ලද වෙළඳපලට ගැලපෙන හස්තකර්මාන්ත නව නිර්මාණ මේ හරහා හඳුන්වාදීමට කටයුතු කරන ලදි.

**ජාතික මෝස්තර මධ්‍යස්ථානයෙන් සේවා ලබාදීම**

2014 වර්ෂය තුල නව නිර්මාණ දැනුවත් කිරීමේ හා ප්‍රායෝගික පුහුණු වැඩසටහන්, ඇනවුම් හා අලෙවි අවස්ථා ලබාදීම, වෙළඳපල,ශිල්පීන්, ක්ෂේත්‍රය පිළිබඳ තොරතුරු ලබාදීම, ආයතනයේ වැඩහල තුල ප්‍රායෝගික පුහුණුව ලබාදීම, පොදු පහසුකම් ලබාදීම, ආයතනයට පැමිණ/ ඉල්ලීම් මත මෝස්තර ලබාදීම (ග්‍රැෆික් නිර්මාණ ඇතුළුව), පුස්තකාල සේවා ලබාදීම අලෙවි ප්‍රවර්ධනය හා අලෙවි පර්යේෂණ වැඩසටහන් වැනි සේවාවන් හරහා 3440 දෙනෙකුට සේවාවන් ලබාදීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානයට කටයුතු කර ඇත.

ඊට අමතරව, හස්තකර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන හා අධ්‍යන කටයුතු සිදුකරන විශ්ව විද්‍යාල හා පාසල් සිසුන්ට ව්‍යාපෘති සඳහා න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබාදීමත් අනෙකුත් පාර්ශවයන් දැනුවත් කිරීම් හා තොරතුරු සැපයීම වැනි සේවාවන් 1000කට ලබාදීමට ඉලක්කර කල අතර ඒ හරහා 11123 දෙනෙකු හට එම සේවාවන් ලබාදීමට කටයුතු කර ඇත.

**ජාතික මෝස්තර මධ්‍යස්ථානය**
**භෞතික ප්‍රගතිය - 2014 දෙසැම්බර් 31 දිනට**

| | ව්‍යාපෘතිය/වැඩසටහන/ක්‍රියාකාරකම් | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | ඉලක්කය | සපුරා ගැනීම |
| **1** | **නව නිර්මාණ සැලසුම් කිරීම සහ සංවර්ධනය** | | |
| 1.1 | සැලසුම් කරන ලද නව නිර්මාණ සංඛ්‍යාව | 690 | **880** |
| 1.2 | සංවර්ධනය කරන ලද නව සාම්පල සංඛ්‍යාව | 370 | **423** |
| 1.2.1 | මොරටුව වැඩහලේ නිමකරන ලද මූලික සාම්පල් සංඛ්‍යාව | | 233 |
| 1.2.2 | නත්තරම්පොත වැඩහලේ නිමකරන ලද මූලික සාම්පල් සංඛ්‍යාව | | 190 |
| 1.3 | ආයතනයේ අවශ්‍යතාවය මත පිටත ශිල්පීන් මගින් නිෂ්පාදනය කරගත් නිර්මාණ සංඛ්‍යාව | 45 | -- |
| **2** | **නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන්** | | |
| 2.1 | වැඩසටහන් | 59 | 61 |
| 2.2 | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 1260 | 1758 |
